# ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී

## වැදගත් කරුණු ලේඛන

### පාරිභෝගික බැංකු සේවා

- *මුදල් නැවත ලබා දීමේ පහසුකම*
- *පුද්ගලික ණය*
- *නිවාස ණය*
- *ආන්තික වෙළෙඳ ව්‍යාපාර*
- *සෝලා වාන්ටේජ් ණය*
- *අධ්‍යාපනික ණය*
- *හෝම් ලෝන් මැක්ස් (නිවාස සම්බන්ධ අවශ්‍යතා සඳහා)*
- *ආචාර විශ්‍රාමික ණය*

වැදගත් කරුණු ලේඛනය - මුදල් නැවත ලබා දීමේ පහසුකම (ණය / බැංකු අයිරා)

| නිපැයුම/ සේවාව | නිෂ්පාදනයේ සේවාවෙහි විශේෂාංග හා ප්‍රතිලාභ | ගාස්තු/ අයකිරීම්, කොමිස් හා ප්‍රමාද ගාස්තු | නිපැයුම/ සේවාව ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග | ප්‍රධාන නියම සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **NDB මුදල් නැවත ලබා දීමේ පහසුකම** (රුපියල්) | • කෙටි කාලයක් තුල මුදල් ලබාගැනීමේ හැකියාව.<br><br>• බැංකුවේ මීට පෙර ගිණුමක් පවත්වා ගෙන ගොස් තිබීම අවශ්‍ය නොවීම.<br><br>• ශාඛාවන්හි පුහුණු සේවක මඬුල්ලෙන් හිමිවන හිතෛශී සේවය.<br><br>• ණය හා බැංකු අයිරා පහසුකම් ලෙස රුපියල් තැන්පතුවෙන් 90% විදෙස් මුදල් තැන්පතුවෙන් 75% ක් ලබා ගත හැකි වීම. (විදෙස් මුදල් තැන්පතු සඳහා දනට බැංකුවේ පවතින ප්‍රතිපත්තියට අදාළව )<br><br>• ණයවර ලිපි සඳහා 90% රුපියල් තැන්පතු මත හා 75% විදෙස් මුදල් තැන්පතු මත<br><br>• බැංකු ඇපකර සඳහා 100% රුපියල් තැන්පතු මත පමණක් | • ණය හා බැංකු අයිරා වල පොලිය ස්ථාවර තැන්පතු /ඉතුරුම් පොලිය හා සම්බන්ධ වේ. මෙම පොලිය, තැන්පතු පොලිය වෙනස් වීම මත වෙනස් වනු ඇත.<br><br>• ගාස්තු / අයකිරීම් හා ප්‍රමාද ගාස්තු පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා බැංකුව විසින් ප්‍රකාශිත ගාස්තු අත්පොත (Tarriff Booklet) වෙත පිවිසෙන්න. | • අයදුම්පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර අත්සන් කිරීම. ආයතනික පහසුකම් (Corperate facilities) සඳහා මාණ්ඩලික අනුමැතිය (Board resolution)අවශ්‍ය ව්‍යාපාර වේ<br><br>• හොඳින් කියවා නියම සහ කොන්දේසි අත්සන් කිරීම.<br><br>• හිලව් කිරීමේ ලිපිය(letter of set-off) නිසි පරිදි සම්පූර්ණ කර අත්සන් කිරීම. (අදාළ නම්)<br><br>• නිසි පරිදි සම්පූර්ණ කර අත්සන් කරන ලද තුන් වන පාර්ශවයේ හිලව් කිරීමේ ලිපිය (Third party letter of set-off) (අදාළ නම්)<br><br>• වලංගු ජාතික හැඳුනුම්පතේ පිටපතක් ඉදිරිපත් කළ යුතු අතර ජාතික හැඳුනුම්පත නොමැති නම් ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් රියදුරු බලපත්‍රය/ විදෙස් ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය<br><br>• Gurantee Bond අදාල නම් | • වයස අවරුදු 18ට වැඩි ශ්‍රී ලංකාවේ වාසය කරන්නෙකු වීම.<br><br>**<u>සුදුසුකම්</u>**<br><br>•බැංකුවේ තැන්පතු හිමි පාරිභෝගිකයෙකු වීම. තුන්වන පාශර්වයන්හි (තනි පුද්ගල /ව්‍යපාර) තැන්පතු සඳහාද මෙ යටතේ ඉඩ සලසයි<br><br>• අවම මුදල රුපියල් 50,000 ක් වන අතර තැන්පතු වටිනාකම අනුව උපරිම මුදල තීරණය වේ.<br><br>• නැවත ගෙවීමේ කාලය උපරිම වසර 05 කි.<br><br>• අදාළ ලියවිලි සම්පූරණ කිරීමෙන් පසු බැංකුවේ පූර්ණ අභිමතය පරිදි මුදල් ලබා දෙනු ලැබේ |

## වැදගත් කරුණු ලේඛනය - පුද්ගලික ණය

| නිපැයුම/ සේවාව | නිෂ්පාදනයේ සේවාවෙහි විශේෂාංග හා ප්‍රතිලාභ | ගාස්තු/ අයකිරීම්, කොමිස් හා ප්‍රමාද ගාස්තු | නිපැයුම/ සේවාව ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග | ප්‍රධාන නියම සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **NDB Dream maker ණය** | ●කෙටි කාලයක් තුළ මුදල් ලබාගැනීමේ හැකියාව<br><br>● බැංකුව සමග පෙර ගිණුම් සම්බන්ධතා අවශ්‍ය නොවීම<br><br>● අතිරේක ඇප අවශ්‍ය නොවීම<br><br>● තරගකාරී පොලී අනුපාතික<br><br>● මරණයකදී හෝ සදාකාලික ආබාධිත තත්ත්වයකදී නොමිලේ රක්ෂණාවරණයක් හිමිවීම<br><br>● අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ණය ලබා දීම<br><br>● මාසික වේතන දිනයේදී නැවත ගෙවීම් සිදුකිරීමට හැකියාව ලැබීම<br><br>● ඕනෑම නීත්‍යානුකූල අරමුණක් සඳහා | ●නවතම පොලී අනුපාතදැනගැනීමට NDB වෙබ් අඩවියට පිවිසෙන්න<br><br>●ගාස්තු / අයකිරීම් හා ප්‍රමාද ගාස්තු පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා බැංකුව විසින් ප්‍රකාශිත ගාස්තු අත්පොත (Tarriff Booklet) වෙත පිවිසෙන්න. | ● අයදුම්පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර අත්සන් කිරීම.<br><br>● හොඳින් කියවා නියම සහ කොන්දේසි අත්සන් කිරීම.<br><br>●රැකියාව හා වැටුප් විස්තරය සේවා යෝජකයා තහවරු කිරීම<br><br>● බැංකුවට වැටුප ප්‍රේෂණය කිරීමට සේවා යෝජකයා සහතික වීම<br><br>● සහතික කරන ලද නවතම වැටුප් වාර්තාව<br><br>● තහවුරු කර අත්සන් කරන ලද ඉල්ලුම් කිරීමේ පොරොන්දු පත්‍රය<br><br>● වලංගු ජාතික හැඳුනුම්පතේ පිටපතක් ඉදිරිපත් කළ යුතු අතර ජාතික හැඳුනුම්පත නොමැති නම් ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් රියදුරු බලපත්‍රය/ විදෙස් ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය<br><br>● පදිංචිය තහවරු කිරීම සඳහා විදුලි බිලක්/ ජල බිලක් හෝ ස්ථාවර දුරකථන බිලක්<br><br>● මාස තුනක බැංකු ප්‍රකාශන<br><br>● ස්වයං රැකියා පහසුකම් අයදුම්පත් සඳහා ආදායම් හා වියදම් ප්‍රකාශන සහ පසුගිය වසර 2ක කාලය සඳහා ශේෂ පත්‍ර | වයස අවුරුදු 18ට වැඩි ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන්/ වලංගු සේවා බලපත්‍රයක් සහිත විදෙස් රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින්<br><br><u>**සුදුසුකම්**</u><br><br>● බැංකුව විසින් පෙර අනුමත කළ සේවා නියුක්තිකයෙකු වීම<br><br>● බැංකුව විසින් අනුමත කළ ආයතනයක් සමග වෘත්තීමය ලියාපදිංචියක් තිබීම<br><br>● ස්වයං රැකියා වෘත්තිකයින්<br><br>● සමාගම් වල හිමිකරුවන්, කොටස්කරුවන්, අධ්‍යක්ෂවරුන් වන ස්වයං වෘත්තිකයින් නොවන අය<br><br>● වලංගු සේවා බලපත්‍රයක් සහිතව විදෙස් රැකියාවක නිරතවන ශ්‍රී ලාංකිකයින්<br><br>**සටහන -:***<br>● වෘත්තීයමය නොවන පුද්ගලයින් සහ ශ්‍රී ලංකාවේ පදිංචි නොවන විදෙස් ශ්‍රමිකයන් සඳහා පිළිගත හැකි සුරැකුම් වලට යටත් වේ.<br><br>● රුපියල් 100,000 ක අවම සහ රුපියල් 10,000,000ක උපරිම ණය පහසුකම<br><br>● අවුරුදු 5 - 8 දක්වා නැවත ගෙවීමට උපරිම කාලයක් හිමි වීම (නැවත ගෙවීමේ කාලය අයදුම්කරුගේ කාණ්ඩය අනුව පදනම් වේ)<br><br><u>නැවත ගෙවීමේ කාලසීමාව</u><br>- වයස 55 දක්වා සහ සමාගමේ විශ්‍රාම ප්‍රතිපත්තිය අනුව 60 දක්වා දීර්ඝ කරනු ලැබේ<br>- වයස 65 දක්වා ස්වයං රැකියා වෘත්තිකයන් හෝ වෘත්තිකයන් නොවන අය |

## වැදගත් කරුණු ලේඛනය- නිවාස ණය

| නිපැයුම/ සේවාව | නිෂ්පාදනයේ සේවාවෙහි විශේෂාංග හා ප්‍රතිලාභ | ගාස්තු/ අයකිරීම්, කොමිස් හා ප්‍රමාද ගාස්තු | නිපැයුම/ සේවාව ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග | ප්‍රධාන නියම සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **NDB** නිවස ණය | • නිවාස ඉදිකිරීම් සම්බන්ධ ඕනෑම කටයුත්තක් සඳහා නිවාස ණය ලබා දීම<br>- ඉඩමක්/නිවසක්මිලදීගැනීමට<br>- ඉදිකිරීම් ණය<br>- විස්තීර්ණ ණය<br>- සංවර්ධන ණය<br>- මහල් නිවාස ණය<br><br>• දේපළ මිලදී ගැනීම, ඉදි කිරීම් හෝ නිවාස අලුත් වැඩියා කිරීම සඳහා වැය කර ඇති මුදල නැවත ණය මුදලක් ලෙස ලබාගැනීමට ඇති හැකියාව.<br><br>• ස්ථාවර සහ විචල්‍ය පොලී අනුපාත තෝරා ගැනීමට ඇති හැකියාව<br><br>• ඔබේ දොරකඩටම වේගවත් සේවාවක් ලබා දීම<br><br>• තරගකාරී පොලී අනුපාත - ETF සාමාජිකයින්ට සුවිශේෂී සහනදායී පොලී අනුපාත<br><br>• අනුමත විදේශ මුදලින් ණය ලබාගැනීමේ හැකියාව (විදේශ රටවල වාසය කරන්නන් සඳහා) | • නවතම පොලී අනුපාත දැනගැනීමට NDB වෙබ් අඩවියට පිවිසෙන්න<br><br>• ණය මුදලෙන් 2%ක් ණය ගාස්තු ලෙස අයකරයි. (රු55,000/-ක උපරිමයකට යටත්ව)<br><br><u>**රක්ෂණය**</u><br><br>-උකස් සුරක්ෂිතතා ප්‍රතිපත්තිය(තනි වාරික)<br>-හිමිකම් රක්ෂණය (අදාළ නම් පමණක්)<br>-සාමාන්‍ය රක්ෂණය (අදාළ නම් පමණක්)<br><br>• උකස් ගිවිසුම සම්පාදනය කිරීම සඳහා වෙනත් ගාස්තු අදාළ වේ<br><br>•ගාස්තු / අයකිරීම් හා ප්‍රමාද ගාස්තු පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා බැංකුව විසින් ප්‍රකාශිත ගාස්තු අත්පොත (Tarriff Booklet) වෙත පිවිසෙන්න | <u>**ආදායම් වාර්තා**</u><br>• ණය අයදුම්පත හොඳින් කියවා අත්සන් කිරීම<br>• ජාතික හැඳුනුම්පතේ/ රියදුරු බලපත්‍රයේ/ විදෙස් ගමන් බලපත්‍රයේ සහතික කළ මුල් පිටපතක්<br>• පසුගිය මාසයේ පඩි වාර්තාව (සත්‍ය හෝ සහතික කළ පිටපතක්)<br><br>• වැටුප, ස්ථිර දීමනා ගෙවීම්, තනතුර, සේවා කාලය සහ විශ්‍රාම ගන්නා වයස පිළිබඳ තොරතුරු තහවුරු කරන සේවායෝජකයාගේ ලිපියක්<br><br>• පසුගිය මාස තුනක බැංකු ප්‍රකාශන (මුල් පිටපත්/ සහතික කළ පිටපත්)<br><br><u>**නීති ලේඛන**</u><br><br>• ඉඩම ලියාපදිංචි කළ දිනයේ සිට වසර 25ක් සඳහා මුල් උපුටා ගැනීම්<br><br>• උප කොට්ඨාස අනුමැතිය සමග ඉඩමේ අවසාන මිණුම් සැලසුම<br><br>• පසුගිය වසර 25 මිණුම් සැලසුම්<br><br>• වසර 25 සඳහා නවතම ඔප්පුව සමග ඔප්පු පිටපත්<br><br>• පලාත් පාලන අධිකාරී සහතික (වීථි රේඛා/නොපැවරීම්/හිමිකම් සහතික)<br><br>• තක්සේරු නිවේදන<br><br>• පසුගිය කාර්තුවේ බදු රිසිට්පත | • වයස 18ට වැඩි ශ්‍රී ලංකාවේ වාසය කරන්නන්/ වලංගු සේවා බලපත්‍රයක සහිතව විදෙස් රටවල සේවය කරන ශ්‍රී ලාංකිකයන් හා ද්විත්ව පුරවැසියන්<br><br><u>**සුදුසුකම්**</u><br><br>• බැංකුව පෙර අනුමත කළ ආයතනයක සේවය කිරීම<br><br>• ස්වයං රැකියාවක නියුත වෘත්තිකයින්<br><br>• සමාගම් වල හිමිකරුවන්, කොටස්කරුවන්, අධ්‍යක්ෂවරුන් වන වෘත්තිකයින් නොවන අය<br><br>• පහත නියමයන්ට යටත්ව වසර 25 දක්වා නැවත ගෙවීමේ කාලයක්<br><br>• වයස 55 සීමාව සමාගමේ විශ්‍රාම යාමේ ප්‍රතිපත්තිය අනුව 70 දක්වා දීර්ඝ කිරීමේ හැකියාව<br><br>• රාජ්‍ය විශ්ව විද්‍යාල සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අනුබද්ධ විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සඳහා වයස 70 තෙක් කාලය දීර්ඝ කර ඇත<br>• ස්වයං රැකියා වෘත්තිකයන් සහ ශ්‍රී ලංකාවේ වාසය නොකරන පිරිස් (NRSL) සඳහා වයස අවුරුදු 70 තෙක්<br><br>• අදාළ දේපල උකස් තැබීමට යටත් වේ (වියන නිවාස ණය යෝජනා ක්‍රමය ඇතුළත්ව) |

| | | | | |
|---|---|---|---|---|
| | | | **<u>සටහන</u>**<br><br>නීති ලේඛන සම්බන්ධයෙන් පැන නගින තත්ත්වයන්හිදී හිමිකම පිළිබඳ බැංකුව විසින් මුල් පිටපත්/සහතික කළ පිටපත් ඉල්ලුම් කළ හැක<br><br>**<u>තාක්ෂණික ලේඛන</u>**<br><br>●ඉදිකිරීමකදී/ අලුත් කොටසක් එකතු කිරීමකදී ගොඩනැගිලි සැලසුම අනුමත කර තිබීම<br><br>● ප්‍රමාණන බිල්පත් ( BOQ) - ඉදිකිරීමකදී/ අලුත් කොටසක් එකතු කිරීමේදී/ වර්ධනයේදී)<br><br>● අත්පිට මුදලට මිලදී ගැනීමේ අවශ්‍යතාවයකදී දේපළ අලෙවි කිරීමට එකඟතාවය පළ කරමින් විකුණුම්කරුගෙන් ලබාගත් ලිපියක්<br><br>● අනුකූලතාවය පිළිබඳ සහතිකය (COC) | ● වියන නිවාස ණය යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලැබීමට අයදුම්කරු විසින් අඛණ්ඩව වසර 5ක් සේවා නියුක්ති භාරකාර අරමුදලට මුදල් බැර කර තිබිය යුතු අතර සහකාර අයදුම්කරු වසර 2ක් ඊට මුදල් බැර කර තිබිය යුතුය.<br><br>● ණය මුදල අනුව තීරණය වන අවම සේවක අර්ථසාධක අරමුදල් ශේෂයක් තිබිය යුතුය |

# වැදගත් කරුණු ලේඛනය - ආන්තික වෙළෙඳ ව්‍යාපාර

| නිපැයුම/ සේවාව | නිෂ්පාදනයේ සේවාවෙහි විශේෂාංග හා ප්‍රතිලාභ | ගාස්තු/ අයකිරීම්, කොමිස් හා ප්‍රමාද ගාස්තු | නිපැයුම/ සේවාව ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග | ප්‍රධාන නියම සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **NDB** ආන්තික වෙළෙඳ ව්‍යාපාර | • ලාභ ඉපැයීම සඳහා කොටස් මිලදී ගැනීම/ගනුදෙනු කිරීම<br><br>• සමූහ කොටස් තැරැව්කාර සාමාගම වන (NDBS ) වෙතින් ලැබෙන ආයෝජන උපදේශනය<br><br>• බැංකුව සමග පෙර ගිණුම් වාර්තා අවශ්‍ය නැත<br><br>• පුහුණු සේවක මඩුල්ලෙන් හිමිවන හිතෛශී සේවය<br><br>• තරගකාරී පොලී අනුපාත | • නවතම පොලී අනුපාත දැනගැනීම සඳහා NDB වෙබ් අඩවියට පිවිසෙන්න | • සබඳතා ගිණුමක් විවෘත කිරීමේ අයදුම්පත (බැංකුවේ KYC අයදුම්පත සමග)<br><br>• ආන්තික වෙළඳ ව්‍යාපාර පහසුකම සඳහා අයදුම්පත්‍රය<br><br>• CDS හා සම්බන්ධ අයදුම්පත් උපදෙස් වලට අනුකූලව නියමිත පරිදි සම්පූර්ණ කිරීම<br><br>• නිවැරදිව පසුගිය මුදල් ප්‍රවාහ තහවුරු කිරීම<br><br>• මුදල් ප්‍රවාහ තහවුරු කිරීම - ගිණුම් ප්‍රකාශන, පඩි වාර්තා<br><br>• සමාගම් ණය සඳහා නම් වසර 3ක මූල්‍ය ප්‍රකාශන<br><br>• ජාතික හැඳුනුම්පතේ/වලංගු විදෙස් ගමන් බලපත්‍රයේ සහතික කළ සත්‍ය පිටපතක්<br><br>• ආන්තික වෙළෙඳ ව්‍යාපාර ගිවිසුම<br><br>• ඇටර්නි බලපත්‍රය (POA)<br><br>• තනි පුද්ගලයින් සඳහා දිවුරුම් ප්‍රකාශන/සමාගම් සඳහා වගකීමේ ලිපිය<br><br>• සමාගම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය<br><br>• CDS ගිණුමෙහි හඳුනාගත් කොටස් සඳහා වූ ප්‍රතිඥාව | • සේවාව ලබාගන්නා දිනට වයස අවුරුදු 18ට වැඩි සහ 60කට නොවැඩි වූ නීත්‍යානුකූලව අයදුම්කරන (සමාගම්/ආයතන)NDB බැංකුවේ දැනට සිටින සහ නව පාරිභෝගිකයින්<br><br>• ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින/නොසිටින ශ්‍රී ලාංකිකයින් (ශ්‍රී ලංකාවේ පදිංචිව නොසිටින අයදුම්කරුවන් සඳහා ශ්‍රී ලංකා මහ බැංකු පූර්ව අනුමැතිය ලබාගත යුතුය)<br><br>• ණය පහසුකම් අවදානම මත බර තබන ලද වෙළෙඳපොල අගය මත 50%ක් වේ. (පවත්වාගත යුතු ආන්තිකය) කෙසේ වෙතත් පෙර දැනුම්දීමකින් තොරව මෙම ප්‍රතිශතය වෙනස් විය හැකිය.<br>**<u>සටහන්</u>**<br>• පවත්වාගත යුතු ආන්තිකය නිරන්තරයෙන්ම නඩත්තු කළ යුතුය. එවැනි අනුපාතිකයන් නඩත්තු නොවන අවස්ථාවලදී අදාළ බර තැබූ අවදානම් වෙළඳපල අගය නඩත්තු කිරීම සඳහා කොටස් ඇවර කිරීමේ අයිතිය බැංකුව සතු වේ.<br><br>• අවම වශයෙන් සමාගම් 3ක් තුළ විවිධ ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි ආයෝජනය කළ යුතු වේ<br><br>• තනි සමාගමක් සමග සිදු කරන ආයෝජන 33.33% නොඉක්මවිය යුතුය<br><br>• අවම පහසුකම 2,000,000 සහ උපරිම පහසුකම 200,000,000 වේ<br><br>• මාස 12ක කාලයක් සඳහා පහසුකම ලබාගත හැකි අතර ඉන් පසුව සමාලෝචනය සහ නැවත අලුත් කිරීම සිදු කෙරේ<br><br>• සැකසුම් සහ නැවත අලුත් කිරීමේ ගාස්තු අය කෙරෙන අතර කාලයෙන් කාලයට අදාළ මුදල දැනුම්දෙනු ලැබේ<br><br>• අදාළ ලියවිලි සම්පූර්ණ කිරීමෙන් පසු, බැංකුවේ ණය ඇගයීම් කාණ්ඩය අනුව බැංකුවේ පූර්ණ අනුමැතිය පරිදි පහසුකම් ලබාදෙනු ලැබේ. |

## වැදගත් කරුණු ලේඛනය - සෝලා වාන්ටේජ් ණය

| නිපැයුම/ සේවාව | නිෂ්පාදනයේ සේවාවෙහි විශේෂාංග හා ප්‍රතිලාභ | ගාස්තු/ අයකිරීම්, කොමිස් හා ප්‍රමාද ගාස්තු | නිපැයුම/ සේවාව ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග | ප්‍රධාන නියම සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **NDB සෝලා වාන්ටේජ් ණය** | • ඇපකර අවශ්‍ය නැත<br>• ඇපකරුවන් අවශ්‍ය නැත<br>• සූර්ය ශක්තියෙන් නිපදවන විදුලි ඒකක මගින් විදුලි බිල අඩුකිරීම<br>• පවත්නා මුදල් ප්‍රවාහයට ගැටලුවක් ඇති නොකර ණය වාරිකය සම්පූර්ණයෙන්ම හෝ බොහෝදුරට ඉතිරිකිරීම් හරහා ආවරණය කෙරේ.<br>• නියමිත ලියකියවිලි තිබේ නම් ඉතා කෙටි කාලයක් තුළ ණය මුදල ලබාගැනීමේ පහසුව<br>• ප්‍රසිද්ධ හා SLSEA අනුමැතිය ලත් නිෂ්පාදකයෙකුගේ උපාංග | • නවතම පොලී අනුපාත දැනගැනීම සඳහා NDBවෙබ් අඩවියට පිවිසෙන්න<br>• ගාස්තු / අයකිරීම් හා ප්‍රමාද ගාස්තු පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා බැංකුව විසින් ප්‍රකාශිත ගාස්තු අත්පොත (Tarriff Booklet) වෙත පිවිසෙන්න | • ණය අයදුම් පත්‍රය (Dream Maker )<br>• පුද්ගලික ණය සඳහා අවශ්‍ය වෙනත් ලියකියවිලි (Dream Maker )<br>• සූයර් පැනල සැපයුම්කරු විසින් නිකුත් කල ලදුපතේ මුල් පිටපත<br>• සූර්ය පැනලය සවිකරන ස්ථානයේ අයිතිය තහවුරු කිරීමේ ලේඛන<br>• වැටුප් ලබන අයදුම්කරුවන් සඳහා සහතික කරන ලද නවතම වැටුප් පත්‍රිකාව සැපයිය යුතුය<br>• ව්‍යවසායකයින් සඳහා පසුගිය වසර 02 සඳහා අදායම් හා වියදම් ප්‍රකාෂය සහා ශේෂ පත්‍රය සැපයිය යුතුය | • වයස 18ට වැඩි ශ්‍රී ලංකාවේ වාසය කරන්නන්/ වලංගු සේවා බලපත්‍රයක් සහිතව විදෙස් රටවල සේවය කරන ශ්‍රී ලාංකිකයන්<br>• උපාංග සඳහා වියදමෙන් 25%ක් අයදුම්කරු විසින් දැරිය යුතුය.<br>• රුපියල් මිලියන 4.5 දක්වා ණය<br>• මාස 60ක් දක්වා ණය ආපසු ගෙවීම් කාලයක්<br>• අදළ මුදල සෘජුවම සැපයුම්කරු වෙත ලබාදේ. යම් ප්‍රතිපූරණ අවස්ථාවක් පැනනගින්නේ නම් නිරවුල් ලියවිලි මත පාරිභෝගිකයාටද අදළ මුදල ලබාදේ. |

## වැදගත් කරුණු ලේඛනය - අධ්‍යාපනික ණය

| නිපැයුම/ සේවාව | නිෂ්පාදනයේ සේවාවෙහි විශේෂාංග හා ප්‍රතිලාභ | ගාස්තු/ අයකිරීම්, කොමිස් හා ප්‍රමාද ගාස්තු | නිපැයුම/ සේවාව ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග | ප්‍රධාන නියම සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **NDB** අධ්‍යාපනික ණය | • උකස් හෝ ඇපකරුවන්ගෙන් තොරව ණය ලබාගැනීමේ හැකියාව<br><br>• එකිනෙකට වෙනස් නම්‍යශීලී ණය ආපසු ගෙවීමේ ක්‍රම දෙකක්<br><br><u>01 ක්‍රමය</u><br><br>• සහන කාලසීමාවක් ලබාගනිමින් එම කාලය තුළ ණයට අදළ පොලිය පමණක් ගෙවීමේ හැකියාව<br><br><u>02 ක්‍රමය</u><br>• සහන කාලයක් නොමැතිව ණය ආපසු ගෙවීම | • නවතම පොලී අනුපාත දැනගැනීම සඳහා NDB වෙබ් අඩවියට පිවිසෙන්න<br><br>• ගාස්තු / අයකිරීම් හා ප්‍රමාද ගාස්තු පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා බැංකුව විසින් ප්‍රකාශිත ගාස්තු අත්පොත (Tarriff Booklet) වෙත පිවිසෙන්න | • ණය අයදුම්පත(Dream Maker )<br><br>• පුද්ලික ණය (Dream Maker )සඳහා අදාල වෙනත් ලියකිවිලි<br><br>• අදළ අධ්‍යාපන ආයතනය වෙත සෘජුවම මුදල් බැරකගිරීමට අදළව කැමැත්ත පළකිරීමේ ලිපියක් අයදුම්කරු ලබාදිය යුතුය<br><br>• 25% ක ගෙවීම් තහවුරුකිරීම<br><br>• අදළ අධ්‍යාපනය ආයතනයෙන් පාඨමාලා තොරතුරු රැගත් ලිපියක් ඉදිරිපත් කළ යුතුය<br><br>• වැටුප් ලබන අයදුම්කරුවන් සඳහා සහතික කරන ලද නවතම වැටුප් පත්‍රිකාව සැපයිය යුතුය<br><br>• ව්‍යවසායකයින් සඳහා පසුගිය වසර 02 සඳහා අදායම් හා වියදම් ප්‍රකාෂය සහා ශේෂ පත්‍රය සැපයිය යුතුය | • ශිෂ්‍යයා රැකියාවක නියුතු වන්නෙකු නොවේ නම් රැකියාවක නියුතු දෙමාපියන් ප්‍රධාන ණය අයදුම්කරු වේ. ශිෂ්‍යයා වයස අවුරුදු 18 ඉක්මවා සිට නම් ඔහුද හවුල් අයදුම්කරුවෙකි.<br><br>• දෙමාපියන් විශ්‍රාම යන දින හෝ වයස අවුරුදු 65 පිරෙන විට ණය මුදල ගෙවී අවසන් විය යුතුය.<br><br>• අවම ණය මුදල රු. 400,000 හා උපරිම ණය මුදල රු. 4,500,000කි.<br><br>• සෑම වාරයකදීම (semester) අදාළ ආයතනයට ගෙවිය යුතු මුදලින් සියයට 75ක් බැංකුවෙන් ලබාදෙන අතර ඉතිරි සියයට 25% අයදුම්කරු විසින් දරාගත යුතුය.<br><br>• ණය පිරිනමන උපරිම කාලසීමාව මාස 96කි. (මාස 48ක සහන කාලයද ඊට ඇතුළත්ය)<br><br>• නියමිත මුදල අදියරෙන් අදියර අදළ අධ්‍යාපන ආයතනයට ගෙවීම සිදුවේ. |

## වැදගත් කරුණු ලේඛනය - හෝම් ලෝන් මැක්ස් ණය (නිවාස සම්බන්ධ අවශ්‍යතා සඳහා)

| නිපැයුම/ සේවාව | නිෂ්පාදනයේ සේවාවෙහි විශේෂාංග හා ප්‍රතිලාභ | ගාස්තු/ අයකිරීම්, කොමිස් හා ප්‍රමාද ගාස්තු | නිපැයුම/ සේවාව ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග | ප්‍රධාන නියම සහ කොන්දේසි |
|---|---|---|---|---|
| **NDB හෝම් ලෝන් මැක්ස් ණය** | • නිවාස ඉදිකිරීම මෙන්ම වෙනත් පෞද්ගලික මූල්‍ය අවශ්‍යතා සඳහා ලබාගත හැක.<br><br>• ඉතා සරල ක්‍රමවේදයක් හරහා කෙටි කාලයක් තුළ ණය මුදල ලබාගැනීමේ පහසුව<br><br>• අවශ්‍ය දෑ පැහැදිලි හා වෙනස් නොවන සුළු වීම<br><br>• ණය කඩිනම් කිරීම සඳහා පලපුරුදු නිලධාරිකයෙකුගේ සහය | **රක්ෂණය**<br><br>- උකස් සුරක්ෂිතතා ප්‍රතිපත්තිය(තනි වාරික)<br><br>- හිමිකම් රක්ෂණය (අදාළ නම් පමණක්)<br><br>- සාමාන්‍ය රක්ෂණය (අදාළ නම් පමණක්)<br><br>• උකස් ගිවිසුම සම්පාදනය කිරීම සඳහා වෙනත් ගාස්තු අදාළ වේ<br><br>• පෙර ගෙවීම්, කොටස් වශයෙන් ගෙවීම්/ සම්පූර්ණ ගෙවීම් සඳහා අය කිරීම ගෙවිය යුතු ශේෂයෙන් 4%කි<br><br>• වැල් ණය සඳහා වූ පොලී අනුපාතයට වඩා 2%ක අතිරේක පොලියක් ප්‍රමාද වාරික සඳහා අයකරනු ලබයි<br><br>• ගාස්තු / අයකිරීම් හා ප්‍රමාද ගාස්තු පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා බැංකුව විසින් ප්‍රකාශිත ගාස්තු අත්පොත (Tarriff Booklet) වෙත පිවිසෙන්න | **අවශ්‍ය ලියකියවිලි**<br><br>• හොඳින් සම්පූර්ණ කරන ලද අයදුම්පත<br><br>• අවසාන වැටුප් පතෙහි මුල් පිටපත (සේවා නියුතු කාණ්ඩයට)<br><br>• මාස තුනක බැංකු ප්‍රකාශන (සේවා නියුතු කාණ්ඩයට)<br><br>• වසර 03ක සමාගම් මූල්‍ය ප්‍රකාශනහා මාස 06 ක බැංකු ප්‍රකාශන හා ව්‍යපාර ලිපදිංචි කිරීමේ සහතිකය (ස්වයං රැකියා නියුතු කාණ්ඩයට)<br><br>• නිවාස සම්බන්ධ අවශ්‍යතාවයක් හඟවන දිවුරුම් ප්‍රකාශයක්<br><br>• දැනට පවත්නා තක්සේරු වාර්තාව වසර 04කට වඩා පැරණි නම් බැංකුව විසින් පත් කරන ලද තක්සේරුකරුවන් වෙතින් ලබාගත් නව තක්සේරු වාර්තාවක් (තක්සේරුකරුවන් ශාඛාවට අයත් වේ)<br><br>• ඉඩමේ පත්ඉරු වල මුල් උපුටා ගැනීම<br><br>• නියමිත පළාත් පාලන ආයතන සහතික ණය ලබා දීමට පෙර බැංකුව වෙත ලබා දිය යුතුය | • සමස්ත පහසුකම අදළ දේපළෙහි කෘත අලෙවි වටිනාකමෙන් (Forced sale value) 75%ක් නොඉක්මවිය යුතුය.<br><br>• උකස් ආරක්ෂණ සේවාවක් හා ගිනි රක්ෂණයක් ලබාගත යුතුය.<br><br>• අවම ණය පහසුකම රු. 250, 000/- සහ උපරිමය රු. 10, 000, 000/- වේ<br><br>• වසර 07ක් දක්වා ණය ආපසු ගෙවුම් කාලයක් |

## වැදගත් කරුණු ලේඛනය - ආචාර විශ්‍රාමික ණය

| නිෂ්පාදනය/ සේවය | නිෂ්පාදනයේ සේවාවෙහි විශේෂාංග හා ප්‍රතිලාභ | ගාස්තු/ අයකිරීම්, කොමිස් හා ප්‍රමාද ගාස්තු | නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන නියම හා කොන්දේසි |
|---|---|---|---|---|
| ආචාර විශ්‍රාමික ණය | • මාසික විශ්‍රාම වැටුප් මුදලට යටත්ව උපරිම ණය මුදලක්.<br>• ඇපකර/ඇපකරුවන් නොමැති වීම.<br>• තරගකාරී පොළී අනුපාතික.<br>• කෙටි කාලයක් ඇතුළත ණය මුදල් ලබා ගැනීමේ හැකියාව.<br>• පුහුණු කාර්ය මණ්ඩලයක් හරහා සුවිශේෂී වූ සේවය.<br>**විශ්‍රාමිකයා මිය යන අවස්ථාවක දී,**<br>• (විශ්‍රාමිකයා විසින් රක්ෂණ වාරික ගෙවනු ලබන) රක්ෂණ යෝජනා ක්‍රමය මගින් ණය මුදල සුරක්ෂිත කරනු ලැබේ.<br>• ඕනෑම නීත්‍යානුකූල අවශ්‍යතාවයක් සඳහා ණය ලබා දේ. | නවතම පොළී අනුපාතික පිළිබඳ දැනගැනීම සඳහා කරුණාකර NDB වෙබ අඩවිය වෙත පිවිසෙන්න.<br><br>ගාස්තු අයකිරීම් හා ප්‍රමාද ගාස්තු පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා බැංකුව විසින් ප්‍රකාශිත ගාස්තු අත්පොත (Tariff Booklet) වෙත පිවිසෙන්න. | • යථා පරිදි සම්පූර්ණ කර අත්සන් කරන ලද ඉල්ලුම්පත්‍රය.<br>• නියම සහ කොන්දේසි සැකෙවින් කියවා අත්සන් කිරීම<br>• වලංගු ජාතික හැඳුනුම්පතේ (NIC) හෝ විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්.<br>• විශ්‍රාම හැඳුනුම්පත (අනිවාර්ය නොවේ)<br>• ස්ථිර ලිපිනය සඳහා බිල්පත්‍ර සාක්ෂියක්.<br>• ආචාර ගිණුමට විශ්‍රාම වැටුප් ප්‍රේෂණය කිරීම සඳහා කැමැත්ත ලබාදීම සහ ඉල්ලුම්කාර විශ්‍රාමිකයාගේ විශ්‍රාම වැටුප වර්තමානයේ වෙනත් බැංකුවක් වෙත බැරකර ඇති අවස්ථාවක දී, විරෝධතා ඉදිරිපත් නොකිරීමේ ලිපිය.<br>• ණය හිඟ මුදල් කහවුරු කිරීම සහ ණය මුදල ලබාගෙන ඇති අවස්ථාවක දී විරෝධතා නොමැති බවට වූ ලිපියක් නිකුත් කිරීම සඳහා වර්තමාන විශ්‍රාම වැටුප් ප්‍රේෂණ බැංකුවෙන් ලබා ගන්නා ප්‍රතිඥා ලිපියක්.<br>• රක්ෂණ වාරික අඩු කිරීම පිළිබඳ ගනුදෙනුකරුගේ කැමැත්ත. | ● ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් විශ්‍රාම වැටුපක් ලබා ගන්නා සහ එය NDB ආචාර ගිණුම වෙත (ඉතුරුම්/ජංගම) බැර කරනු ලබන පුද්ගලයකු විය යුතු යි.<br><br>සටහන<br><br>● විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ලබන අවම සේවාකාලය සම්පූර්ණ කර විශ්‍රාම කාලයට ප්‍රථම සේවයෙන් විශ්‍රාම ලබා ඇති සන්නද්ධ හමුදා සාමාජිකයින් මේ සඳහා සුදුසුකම් ලබයි.<br>● ආබාධිත සන්නද්ධ හමුදා සාමාජිකයින්ට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ ඔවුන්ට හිමි විශ්‍රාම වැටුප් ප්‍රමාණය සඳහා පමණක් මේ යටතේ සුදුසුකම් ලබයි.<br>● විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ තම මියගිය කලාත්‍රයාගේ විශ්‍රාම වැටුප හිමි වයස අවුරුදු 35ට වැඩි වැන්දඹු ස්ත්‍රීන් හා පුරුෂයින් මේ යටතේ සුදුසුකම් ලබයි.<br><br>● අවම විශ්‍රාම වැටුප් මුදල - රු. 6,000/-<br>● අවම ණය මුදල - රු. 100,000/-<br>● උපරිම ණය මුදල - රු. 4,500,000/-<br>● උපරිම වයස් සීමාව - අවුරුදු 75 යි.<br>● උපරිම ණය කාලසීමාව - අවුරුදු 15 යි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | • අදාල වේ නම්, යථා පරිදි අත්සන් කරන ලද සෞඛ්‍ය ප්‍රකාශනය.අදාල වේනම් විචල්‍ය පොලී අනුපාතිකය සඳහා ගනුදෙනුකරුගේ කැමැත්ත | |

## පැමිණිලි කිරීමේ ක්‍රියා පටිපාටිය

**ඔබගේ පැමිණිලි, අදහස් සහ යෝජනා පහත මාගර්යන් ඔස්සේ අප බැංකුව වෙත ඉදිරිපත් කල හැකː**

ඔබගේ ගිණුම් පවත්වාගන යනු ලබන බැංකු ශාඛාවට පැමිණ හෝ දුරකථන මාගර්ය හරහා බැංකු ශාඛා කළමණාකරු හෝ ඔබගේ සම්බන්ධතා කළමනාකරු හා සමඟ සම්බන්ධ වීම මගින් අපගේ පැය 24 පුරා ක්‍රියාත්මක සම්බන්ධතා මධ්‍යස්ථාන අංක +94 (0) 11 2448888 / +94 (0)117448888 ඔස්සේ

අපගේ විද්‍යුත් තැපැල් ලිපිනය වන contact@ndbbank.com හරහා

ඔබගේ ලිපිය ලියාපදිංචි තැපැල් මාගර්ය ඔස්සේ පහත ලිපිනය වෙත යොමු කිරීම මගින් : කළමනාකරු - පාරිභෝගික සබඳතා අංශය, නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී, අංක 92, බනර්ාඩ් සොයිසා මාවත, කොළඹ 05

බැංකුව විසින් තෘප්තිමත් විසඳුමක් ලබා දී නොමැති අවස්ථා වලදී, පාරිභෝගිකයාට තම පැමිණිල්ල ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය වෙත ගොනු කළ හැකිය.

ආනන්ද කුමාරදාස මහතා, මූල්‍ය
ඔම්බුඩ්ස්මන්,
මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය,
143A,
වජිර පාර,
කොළඹ 05.

දුරකතන අංක: +94 11 259 5624
ටෙලිෆැක්ස්: +94 11 259 5625
ඊමේල්: fosril@sltnet.lk
වෙබ් අඩවිය: www.financialombudsman.lk

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාතර්මේන්තුව (CBSL - FCRD)
තැපැල් ලිපිනය:
මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාතර්මේන්තුව,
අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.

විමසීම් සඳහා ක්ෂණික ඇමතුම් අංකය : 1935
දුරකථන : +94 112477966
ෆැක්ස් : +94 112477744
විද්‍යුත් තැපැල : fcrd@cbsl.lk